---

**පලාගල ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 11 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 20 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පලාගල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරන අඩුපාඩු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ 05 ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.117,025 ක විගණන ගාස්තු හා සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ). විශ්‍රාම වැටුප් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුව තිබුණු රු.323,164 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ). ලේඛන අතර වෙනස්කම් නිවැරදි කිරීම සඳහා කර්මාන්ත ණයගැති වටිනාකම රු.4,252,021 ක් හා කර්මාන්ත ණයහිමි වටිනාකම රු.3,450,002 ක් පිළිවෙලින් සමුච්චිත අරමුදලට හර හා බැර කර ඇතත් ගිණුම්වල සටහන් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ගැලපීම් වල අවශ්‍යතාවය තහවුරු කර නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව වූ රු. 79,198,654 ක්වූ වත්කම් විෂයයන් 11 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 2,215,912 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,095,028 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 180 ප්‍රකාරව මුදල් හෝ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන් හෝ ආදායම් සම්බන්ධව රාජකාරි ඉටු කරන නිලධාරීන් විසින් ඇප තැන්පත් කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් බදු | 400 | 529 | - |
| (ii). | බදු කුලී | 1,008 | 734 | 274 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 105 | 174 | - |
| (iv). | වෙනත් ආදායම් | 7,714 | 5,627 | 2,087 |

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 408,191 |
| (ii). | මුද්දර ගාස්තු | 946,540 |

### 2.3.3 දුරකථන කුළුණු ගාස්තු

බල ප්‍රදේශයේ සවිකර තිබුණු දුරකථන කුළුණු 05 ක් වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි.

### 2.3.4 පරිසර බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයේදී පරිසර බලපත්‍ර ගාස්තු අය කිරීමට කටයුතු නොකිරීම නිසා ව්‍යාපාර 28 කින් අයකර ගත හැකිව තිබුණු පරිසර බලපත්‍ර ආදායම් රු.84,000 ක් අහිමි වී තිබුණි.

**2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව විසින් කසල කළමනාකරණ වැඩ සටහනක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ). ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි

(ඇ). අනුමත සීමාව ඉක්මවා බඳවා ගන්නා ලද සේවකයින් 07 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.721,142 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේදී පෞද්ගලික ආයතනයකට වැඩිපුර ගෙවන ලද රු.98,000 ක් ආපසු අයකර ගෙන නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අභ්‍යන්තර විගණනය

(ඇ). වත්කම් කළමනාකරණය